# ජාතික පොහොර සහනාධාර ප්‍රතිපත්තියෙහි ක්ෂේත්‍ර ගැටලු
## (අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)

යූ.එස්.ඩී. අනුරසිරි[1] බී.ඒ.එන්.පී. බාලසූරිය[2]
ආර්.පී.එච්. මුතුමාලි[3] අයි.එම්. පේමචන්ද්‍ර[4]
ඩබ්.ඒ.එල්.කේ. ජයසිංහ[5] එම්.කේ. නදීකා දමයන්ති[6]

**සංක්ෂේපය**

රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය යටතේ මෙරට ගොවි ජනතාවට පොහොර සහනාධාරය වසර ගණනාවක් තිස්සේ ලබාදෙන අතරක්‍රියාත්මකභාවයේදී එහි යම් යම් ගැටලු සහගත තත්ත්වයන්මතුවන බව එදිනෙදා සාකච්ඡා තුළින් පෙනී යයි. මෙම අධ්‍යයනයට පාදක වූ මූලික ගැටලුව වන්නේ රාජ්‍ය කෘෂිකාර්මික ප්‍රතිපත්තිය තුළ පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක වීමේ දී ගැටලු උද්ගත වන්නේද ? එසේනම් ඒ මොනවාද? යන්න හඳුනා ගැනීමයි. එහිදී වී වගාව සිදු කරන ප්‍රධානතම දිස්ත්‍රික්කයක් වන අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගල්නෑව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් ගලටබැඳිවැව ග්‍රාම නිලධාරී වසම ක්ෂේත්‍රය වශයෙන් තෝරා ගැණිනි. අධ්‍යයන නියැදියට අහඹු ලෙස තෝරාගත් ගොවීන් 50ක් ඇතුළත් වූ අතර ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා හරහා ප්‍රාථමික දත්ත සහ තොරතුරු සපයා ගැණිනි. එමෙන්ම නිරීක්ෂණ ආශ්‍රිතවද ඇතැම් තොරතුරු ලබා ගන්නා ලදි. ලබාගත් දත්ත සහ තොරතුරු විශ්ලේෂණයේදී සරල සංඛ්‍යානමය විධික්‍රම සහ විස්තරාත්මක ක්‍රමවේදය යොදාගැණිනි. අධ්‍යයනයෙන් හෙළි වූ අන්දමට සහනාධාර ප්‍රතිපත්තිය යටතේ අවශ්‍ය අවස්ථාවට පොහොර ලබාගත හැකි බව ප්‍රතිචාරීන්ගෙන් 72% ද, ලබාගත නොහැකි බව 28% ද ප්‍රකාශ කළහ. ප්‍රතිචාරීන්ගෙන් 60%ක් ලබාදෙන පොහොර ප්‍රමිතියෙන් යුතු බවත්, 40%ක් පොහොර ප්‍රමිතියෙන් තොර බවත් ප්‍රකාශ කළහ. සහනාධාරය සම්බන්ධයෙන් අදහස් දක්වන ප්‍රතිචාරීන්ගෙන් 18%ක් සහන මිලකට පොහොර ලබාගත හැකිවීම, ගොවීන්ට ලාභදායීවීම (12%) මේ සම්බන්ධයෙන් පවතින යහපත් තත්ත්ව වශයෙන් අනාවරණය කෙරිණි. කෙසේ වුවද, අධ්‍යයනය තුළින් අනාවරණය කරගත් අන්දමට පොහොර සහනාධාර වැඩපිළිවෙළෙහි ක්‍රියාත්මක භාවයේදී අවශ්‍ය පොහොර ප්‍රමාණය නොලැබීම, පොහොරවල ගුණාත්මකභාවය සහ ප්‍රවාහනය යනාදී ගැටලු උද්ගත වී ඇත.

**මුඛ්‍ය පද ඃ** *පොහොර සහනාධාරය, රාජ්‍ය ප්‍රතිපත්ති, ගොවීන්, වී වගාව*

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[2] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[3] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[4] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[5] ශාස්ත්‍රවේදී (විශේෂ) දේශපාලන විද්‍යා, කැලණිය විශ්වවිද්‍යාලය.

[6] ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, damayanthi@kln.ac.lk